**විද්‍යා හා තාක්‍ෂණ මානව සම්පත් සංවර්ධන ව්‍යාපෘතිය - 2019**

**------------------------------------------------------------------------------**

විද්‍යා හා තාක්‍ෂණ මානව සම්පත් සංවර්ධන ව්‍යාපෘතියේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ආසියානු සංවර්ධන බැංකුව අතර 2019 ජනවාරි 17 දින එළඹි අංක 3698 එස්ආර්අයි හා 3699 එස්ආර්අයි (සීඔඑල්) ණය ගිවිසුම් වල IV ව්‍යවස්ථාවේ 03 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත වාර්තා කළ යුතු යැයි මා සලකන මාගේ අදහස් හා නිරීක්‍ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

ව්‍යාපෘතියේ ණය ගිවිසුම් අනුව, එවකට උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය වර්තමානයේ උසස් අධ්‍යාපන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර කැලණිය විශ්වවිද්‍යාලය, රජරට විශ්වවිද්‍යාලය, සබරගමුව විශ්වවිද්‍යාලය සහ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. උසස් අධ්‍යාපන පද්ධතියට රැකියාභිමුඛව තාක්ෂණික උපාධි වැඩසටහන් ඇතුළත් කිරීමේ ප්‍රවේශ පහසුකම් වැඩිදියුණු කිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ. (අ) නවෝත්පාදන තාක්ෂණික ඉගෙනුම් හා පර්යේෂණ පරිසරයක් ඇති කිරීම (ආ) ගුණාත්මක උසස් තාක්ෂණික අධ්‍යාපන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම (ඇ) කාර්මික සහ ජාත්‍යන්තර පර්යේෂණ සම්බන්ධතාවය සවිබලගැන්වීම (ඈ) පීඨ කළමනාකරණ ධාරිතාවය සවිබල ගැන්වීම සහ (ඉ) නවීන ව්‍යාපෘති සංවර්ධන පහසුකම් සැපයීම යන සංරචක 05 යටතේ ව්‍යාපෘතියේ කටයුතු ක්‍රියාත්මක වේ. ණය ගිවිසුම් අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 30,051.45 කට සමාන එජඩො මිලියන 165 ක් වූ අතර ඉන් රු.මිලියන 26,408.45 කට සමාන එජඩො මිලියන 145 ක් සැපයීම සඳහා ආසියානු සංවර්ධන බැංකුව එකඟ වී තිබුණු අතර එකතුව රු.මිලියන 3,543 ක් ශ්‍රී ලංකා රජය මූල්‍යනය කිරීමට අපේක්ෂා කෙරේ. ව්‍යාපෘතිය එහි කටයුතු 2018 අප්‍රේල් 17 දින ආරම්භ කරන ලද අතර 2023 දෙසැම්බර් 31 වන විට නිම කිරීමට නියමිතය.

## 1.3 මතය

ව්‍යාපෘතියේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්වලට (ශ්‍රී.ල.වි.ප්‍ර) අනුකූල වන විගණනය සිදු කරන ලදි.මෙම විගණන ප්‍රමිත යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත.මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය

ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තිරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබා දීම සහ මාගේ මතය ඇතුලත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත.වංචා හා වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශයන් ඇති විය හැකි අතර මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශචය සහ වෘත්තීය සැක මුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි., තවද

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට,ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ.ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර,දුස්සන්ධානය,ව්‍යාජ ලේඛණ සැකසීම,චේතනාන්විත මඟ හැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතු වේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත් අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල කළමනාකරණය විසින් කරන ලද සාධාරණත්වය හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම ව්‍යූහය සහ අන්තර්ගතය ඇගයීමට ලක් කල අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධින් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශන වල ඇතුලත් බව අගයන ලදී.

මාගේ විගණනය තුලදී හඳුනාගත් වැදගත් විගණන සොයා ගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දූර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

**2.** **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.1** **ගිණුම්කරණ අඩුපාඩු**

| **ගිණුම්කරණ අඩුපාඩු** | **මුදල** | **බලපෑම්** | **කළමනාකරණයේ ප්‍රතිචාර** | **විගණකගේ නිරීක්ෂණ** |
|---|---|---|---|---|
| | රු.මිලියන | | | |
| (i) 2018 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ උපචිත වියදම ලෙස රු.215,258 ක් වෙන්කර තිබුණද, සමාලෝචිත වර්ෂයේ සත්‍ය වියදම රු.16,194,460 විය. එම නිසා 2019 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ උපචිත වියදම වැඩියෙන් දක්වා තිබුණි. | 15.98 | වැඩියෙන් දක්වා තිබුනි. (උපචිත වියදම්) | 2018 වර්ෂය සඳහා මෙයෙහුම් වියදම රු.16,194,460 ක් විය. ඉන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු.215,258.25 උපචිත වියදම් විය. ප්‍රාග්ධනිත කල යුතු මුළු මෙහෙයුම් පිරිවැය 2018 වර්ෂයේ දී කපා හැර තිබුණි. ගැලපුමක් ලෙස එය 2019 මූල්‍ය ප්‍රකාශනවල ප්‍රාග්ධනිත කර ඇත. | වර්ෂය අවසාන දිනට සත්‍ය වියදම් මූල්‍ය ප්‍රකාශනවලට ගැනීම අවශ්‍ය වේ. |
| (ii) 2019 දෙසැම්බර් 31 දිනට විදේශ සම්පත් දෙපාර්තමේන්තුව මගින් සපයන ලද ප්‍රකාශයේ දැක්වෙන වියපැහැදම් කරන ලද රු.මිලියන 663.9 ක ණය මුදල මහ බැංකු ප්‍රකාශයේ දැක්වෙන රු.මිලියන 641.8 ක වියපැහැදම් මුදල සමඟ එකඟ නොවුණි. | 22.11 | නොසැසඳුන ශේෂ | ව්‍යාපෘති ණය මුදල බලාත්මකවීමට පෙර පසුගාමී මූල්‍යකරණය පදනම මත ක්‍රියාත්මක කර තිබුණි. ණය ගිවිසුම අත්සන් කිරීමෙන් සහ ණය මුදල බලාත්මක වීමෙන් පසු ආසියානු සංවර්ධන බැංකුව විසින් පසුගාමී මූල්‍යකරණය යටතේ දරන ලද (රු. මිලියන 21.2) භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙත සෘජුවම ප්‍රතිපූර්ණය කර ඇත. මෙම ගණුදෙනුව සහ මහ බැංකුවේ මැදිහත් වීමකින් තොරව සෘජුවම ණය ගිණුමෙන් වියපැහැදම් කරන ලද ප්‍රාග්ධනිත කරන ලද ණය පොළී මහබැංකුව ඉදිරිපත් කරන ලද වාර්තාවල නොදැක්වේ. තවද විදේශ සම්පත් දෙපාර්තමේන්තුව සහ මහ | සංඛ්‍යා සැසඳීම් අවශ්‍ය වන අතර. එය සුදුසු පරිදි මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කළ යුතුය. |

බැංකුවවෙනස් විනිමය අනුපාත 2 ක් භාවිතා කර ඇත. මෙයද වෙනස සඳහා බලපා ඇත. මහ බැංකු ශේෂය සමග විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ (DRMS) වාර්තාව සැසඳුම් ප්‍රකශය ඇමුණුම 1 හි දක්වා ඇත.

## 3. භෞතික කාර්යසාධනය

### 3.1 ව්‍යාපෘතියේ කටයුතු පිළිබඳ භෞතික ප්‍රගතිය

ව්‍යාපෘතියේ කටයුතු සංරචක 05 ක් යටතේ ක්‍රියාත්මක වේ.

(අ) නවීන තාක්ෂණය සහ කාර්මික අංශයට අදාළ අධ්‍යාපනය සහ පර්යේෂණ සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම.

(ආ) කාර්මික ඉල්ලුම සහ ජාත්‍යන්තර ප්‍රමිතීන් සමග ගැලපෙන ආකාරයට ගුණාත්මක විෂයමාලා සැලසුම් කිරීමට සහ පීඨ කළමණාකරණය සඳහා සහයවීම.

(ඇ) තරඟකාරි කර්මාන්ත සහ විදේශ විශ්ව විද්‍යාල සහයෝගීතා යෝජනා ක්‍රම සැපයීම.

(ඈ) ධාරිතා වර්ධන අවස්ථා

(ඉ) 2021 වර්ෂයේ අනුමත කිරීම සඳහා යෝජනා කරන නව උසස් අධ්‍යාපන ව්‍යාපෘති සකස් කිරීමේදී රජයට සහය ලබාදීම.

| සංරචකය | ක්‍රියාකාරකම් | ආරම්භ කිරීමට සැලසුම් කළ කාලය | ආරම්භ කළ දිනය | බලපෑම් | කළමනාකරණයේ අදහස් දැක්වීම් | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|---|---|
| -------- | ------------- | --------- | ---------- | ------------- | -------------------- | ----------- |
| (i) නවීන තාක්ෂණික ඉගෙනුම් හා පර්යේෂණ පරිසරයක් ස්ථාපනය කිරීම. | නිර්මාණය සහ ඉදිකිරීම් පදනම යටතේ විශ්ව විද්‍යාල 04 ක් සඳහා ගොඩනැගිලි ඉදිකිරීම් සඳහා ලංසු ලියවිලි සකස් කිරීම. | 2018 වර්ෂය තුළදී | 2019 | ව්‍යාපෘති කාලය තුළදී ඉදිකිරීම් කටයුතු නිම කිරීමට නොහැකි වන අතර, පිරිවැය ඉහළ යාමේ හැකියාව පවතී. | ආසියානු සංවර්ධන බැංකුවේ නිර්මාණ සහ ඉදිකිරීම් සඳහා සම්මත ලංසු ලියවිලි නොමැති වීම හා නිර්මාණය ඉදිකිරීම් ක්‍රමය ආසියානු සංවර්ධන බැංකුවට නව දෙයක් වූ බැවින් සම්මත ලංසු ලියවිලි සකස් කිරීම සඳහා සැලකිය යුතු කාලයක් ගතවී ඇත. | ප්‍රමාදයන් ආවරණය කර ගැනීමට සහ අමතර පිරිවැය වළක්වා ගැනීමට කාලීනව කොන්ත්‍රාත් වැඩ අවසන් කර ගැනීම සහතික කර ගැනීමට පියවර ගත යුතුය. |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | **වර්තමාන තත්ත්වය** සියළුම සිවිල් වැඩ සඳහා ලංසු කැඳවීම අවසන් කර ඇත. කැළණිය ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව පිරිනැමීම සඳහා නිර්දේශය ලබාගැනීමට අමාත්‍ය මණ්ඩලය වෙත යවා ඇත. සබරගමුව විශ්ව විද්‍යාලය සහ ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය සඳහා තාක්ෂණික ඇගයීම් කටයුතු අවසන් කර අනුමැතිය සඳහා SCAPC වෙත ඉදිරිපත් කර ඇති අතර රජරට විශ්වවිද්‍යාලයේ ඉදිකිරීම් සඳහා තාක්ෂණික ඇගයීම් කටයුතු සිදුකරමින් පවතී. සිවිල් වැඩ කොන්ත්‍රාත් හතරම 2020 වර්ෂය තුළදී පිරිනැමීමට සහ ව්‍යාපෘති කාලපරිච්ඡේදය තුලදී නිම කිරීමට සැලසුම් කර ඇත. | |
| (ii) | නවීන තාක්ෂණික ඉගෙනුම් හා පර්යේෂණ පරිසරයක් ස්ථාපනය කිරීම. | විස්තරාත්මක සැලැස්ම අනුමත කිරීම, ඉදිකිරීම් සැලැස්ම නිම කිරීම සහ කැලණිය, රජරට, ශ්‍රී ජයවර්ධනපුර හා සබරගමුව විශ්ව විද්‍යාලවල සිවිල් වැඩ ආරම්භ කර ඇත. | 2019 4 වන කාර්තුවේ | මේ දක්වා ආරම්භ කර නොමැත. | ව්‍යාපෘති කාලය තුලදී ඉදිකිරීම් කටයුතු නිම කිරීමට නොහැකි වන අතර පිරිවැය ඉහළ යාමේ හැකියාව පවතී. | අවශ්‍ය අනුමැතිය ලබාගැනීම සහ සිවිල් වැඩ සඳහා ඉදිකිරීම් සැලැස්ම නිම කිරීම, නිර්මාණය සහ ඉදිකිරීම් කොන්ත්‍රාත්තුවේ කොටසක් වේ. ලංසු අදියරේදී විස්තරාත්මක සැලස්ම් කොටස සඳහන් කාලරාමුව තුල නිම කිරීම හා ඉදිකිරීම් | -එම- |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | | | | නිමකිරීමට ලංසුකරුවන් එකග වී ඇත. | |
| (iii) ගුණාත්මක සහ කාර්මික අංශයට අදාළ උසස් තාක්ෂණික අධ්‍යාපන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. | කාන්තා සහභාගීත්වයෙන් යුතු සේවානියුක්ති කේන්ද්‍ර කර ගත් නව උපාධි වැඩසටහන් ඇතුළුව කාර්මික ව්‍යවස්ථාව මෙහෙයවීම. | 2018 වර්ෂය තුලදී | 2020 වර්ෂයේදී | අපේක්ෂිත පාර්ශ්වයන් වෙත බලාපොරොත්තු වන ප්‍රතිලාභ නොලැබීම. | විෂය නිර්දේශ සහ චක්‍රලේඛ සකස් කිරීමේදී විවිධ අදියරයන් වලදී කාර්මික උපදේශනයන් ලබාදී ඇත. 2020 පෙබරවාරි ස්ත්‍රී පුරුෂභාවය පිළිබද විශේෂඥ බදවා ගෙන තිබුණි. ස්ත්‍රී පුරුෂභාවය පිළිබද විශේෂඥ කාන්තා සහභාගීත්වයෙන් යුතු සේවානියුක්ති කේන්ද්‍ර කර ගත් නව උපාධි වැඩසටහන් ඇතුළුව කාර්මික උපදේශනය සිදුකිරීමට අපේක්ෂා කෙරේ. | ව්‍යාපෘති ඇගයීම් ලේඛනයේ සඳහන් අවශ්‍යතාවයන් සමග අනුකූල වීම අවශ්‍ය වේ. |
| (iv) පීය කළමනාකරණ ධාරිතාවය සවිබල ගැන්වීම | විශ්ව විද්‍යාල හතරෙහි කාන්තාවන් සඳහා විශේෂ වැඩසටහන් ඇතුළත්ව වෘතීය මාර්ගෝපදේශ සහ රැකියා සඳහා මගපෙන්වන මධ්‍යස්ථාන සඳහා මෙහෙයුම් අත්පොත් සංවර්ධනය කිරීම. | 2019 2 වන කාර්තුවේ | මේ දක්වා ආරම්භ කර නොමැත. | ශිෂ්‍යයින් වෙත බලාපොරොත්තු වන පහසුකම් නොලැබීම. | 2020 පෙබරවාරි ස්ත්‍රී පුරුෂභාවය පිළිබද විශේෂඥ බදවා ගෙන තිබුණි. ස්ත්‍රී පුරුෂභාවය පිළිබද විශේෂඥ සමග කාන්තාවන් සඳහා විශේෂ වැඩසටහන් ඇතුළත්ව මෙහෙයුම් අත්පොත් සංවර්ධනය කිරීම සඳහා පියවර ගනු ලැබේ. | තවදුරටත් ප්‍රමාදවීමකින් තොරව ප්‍රමාදවූ කටයුතු ආවරණය කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (v) නව උසස් අධ්‍යාපන ව්‍යාපෘති සකස් කිරීම සඳහා සහය ලබාදීම. | උසස් අධ්‍යාපනය හෝ නවෝත්පාදන සඳහා ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා සම්බන්ධ සැලසුම් අංග | 2019 1 වන කාර්තුවේ | මේ දක්වා ආරම්භ කර නොමැත. | ව්‍යාපෘති කාලපරිච්ජේදය තුළදී ව්‍යාපෘතියේ අපේක්ෂිත ප්‍රතිඵල නිම කිරීමට | ව්‍යාපෘතියේ ප්‍රතිඵල 5, නව උසස් අධ්‍යාපන ව්‍යාපෘති සංවර්ධනය සඳහා සහය වේ. නව ව්‍යාපෘති සඳහා දිශාව පිළිබද විවිධ වැඩසටහන්වලදී දිර්ස | තවදුරටත් ප්‍රමාදවීමකින් තොරව ප්‍රමාදවූ කටයුතු ආවරණය කර ගැනීමට කටයුතු කළ |

| | | | |
|---|---|---|---|
| ඇතුලත්ව සංකල්ප පත්‍රය සකස් කිරීම. | | නොහැකිවේ. | වශයෙන් සාකච්ඡා කර ඇත. ස්යෙහාගායේ දැක්ම ජාතික ප්‍රතිපත්ති රාමුව සහ රජයේ දැක්ම යටතේ නව උසස් අධ්‍යාපන ව්‍යාපෘති හඳුනා ගැනීම සඳහා දැනටමත් අමාත්‍යංශය සහ ආසියානු සංවර්ධන බැංකුව අතර ද්වීපාර්ශවික සම්බන්ධතා සිදුකර ඇත. | යුතුය. |

**3.2 කොන්ත්‍රාත් පරිපාලනය**

| විගණන ගැටළුව | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| ව්‍යාපෘති පරිපාලන අත්පොතට අනුව කැලණිය, රජරට, සබරගමුව සහ ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලවල සිවිල් කටයුතු 2019 වර්ෂයේ අවසාන කාර්තුවේ ආරම්භ කළ යුතුය. ලැබී තිබුණු තොරතුරු අනුව 2019 දෙසැම්බර් 31 දින වනවිටත් ඉහත සිවිල් කටයුතු සඳහා සුදුසු කොන්ත්‍රාත්කරුවන් තෝරාගැනීමේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය අවසන් කර නොතිබුණි. | ව්‍යාපෘතියේ කටයුතුවල ප්‍රමාදයන් සිදුවන අතර, වියපැහැදම් නොවූ ශේෂය මත බැදීම් ගාස්තු ගෙවීමට සිදුවේ. | සියළුම සිවිල් වැඩ සඳහා ලංසු කැඳවීම් අවසාන කර ඇත. කැලණිය විශ්වවිද්‍යාලයේ ඉදිකිරීම්වල කොන්ත්‍රාත් ප්‍රදානය සඳහා නිර්දේශ කැබිනට් මණ්ඩලයේ අනුමැතිය සඳහා යොමු කර ඇත. සබරගමුව සහ ජයවර්ධනපුර විශ්වවිද්‍යාලවල තාක්ෂණික ඇගයීම් කටයුතු අවසන් කර SCAPC අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත. රජරට විශ්වවිද්‍යාලයේ ඉදිකිරීම් සඳහා තාක්ෂණික ඇගයීම් කටයුතු සිදුකරමින් පවතී. කොන්ත්‍රාත් හතරම 2020 වර්ෂය තුළදී පිරිනැමීමට සැලසුම් කර ඇත. | ප්‍රමාදයන් ආවරණය කර ගැනීමට සහ අමතර පිරිවැය වළක්වා ගැනීමට කාලීනව කොන්ත්‍රාත් වැඩ අවසන් කර ගැනීම සහතික කර ගැනීමට පියවර ගත යුතුය. |

**3.3 වැඩබිම් පරීක්ෂාවේ සිදුකරන ලද නිරීක්ෂණය**

| | විගණන ගැටළු | බලපෑම් | කළමනාකරණයේ අදහස් දැක්වීම් | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| (i) | <u>කැළණිය විශ්ව විද්‍යාලය</u><br>පරිගණක හා තාක්ෂණික දූර්වල පීඨයේ රසායනවිද්‍යා කොන්ත්‍රාත් | | <u>**එස්ටීඑච්ආර්ඩී/කේර්-ර් 20**</u><br>මෙම කොන්ත්‍රාත්තුව ලංසුකරුවන් කොන්ත්‍රාත් ගිවිසුමේ තිදෙනෙකුට පිරිනමන ලදි. පහත සඳහන් කොන්දේසි | |

| | | | | |
|---|---|---|---|---|
| | රසායනාගාරය සඳහා රු.306,666 ක් වටිනා රසායන ද්‍රව්‍ය 33 ක් සැපයීමට 2019 අගෝස්තු 26 දින කැලණිය විශ්ව විද්‍යාලය රසායනික ද්‍රව්‍ය සැපයුම්කරුවන් තුන්දෙනෙකු සමඟ ගිවිසුම්වලට එළඹ තිබුණි. කොන්ත්‍රාත් ගිවිසුමේ 3.2.1 සාමාන්‍ය කොන්දේසිට අනුව, ගිවිසුම්ගත දින සිට සති 08 ක් ඇතුළත ව්‍යාපෘති කළමනාකරණ ඒකකය වෙත රසායනික ද්‍රව්‍ය භාරදිය යුතුය. කෙසේ වෙතත් විගණිත දිනය වූ 2020 පෙබරවාරි 25 වනවිටත් ඉහත ද්‍රව්‍ය ව්‍යාපෘති කළමනාකරණ ඒකකය වෙත භාරදී නොතිබුණි. | පරිපාලනය හේතුවෙන් අලාභ සිදුවිය හැක. | සමාගම් 2 ගිවිසුම්ගත දින සිට සති 08 ක් ඇතුලත භාණ්ඩ බෙදාහැර තිබුණි.<br>1. ඇනලිටිකල් ඉන්ස්ට්‍රුමන්ට් (පුද්ගලික) සමාගම, 2019 ඔක්තෝබර් 22 දිනට පෙර බෙදාහැර තිබුණි.<br>2. හෙම්සන් ඉන්ටනැෂනල් (පුද්ගලික) සමාගම 2019 ඔක්තෝබර් 04 දිනට පෙර බෙදාහැර තිබුණි.<br>3. ඇවොන් ෆාර්මෝචෙම් (පුද්ගලික) සමාගම භාණ්ඩ සති 08 ක් ඇතුලත බෙදාහැර තිබුණි. කෙසේවෙතත් මේ වනවිට භාණ්ඩ බෙදාහැර ඇත. | සමග අනුකූල වීමට කොන්ත්‍රාත්කරුවන් පෙළඹවීමට පියවර ගැනීමට අවශ්‍ය වේ. |
| (ii) | ව්‍යාපෘති පරිපාලන අත්පොතට අනුව, පරිගණක හා තාක්ෂණික පීඨයේ භෞතික විද්‍යා රසායනාගාරය සඳහා විද්‍යාගාර උපකරණ මිලදී ගැනීම 2018 වර්ෂයේ තුන්වන කාර්තුවේ ආරම්භ කළ යුතුය. කෙසේවෙතත් ප්‍රසම්පාදන ක්‍රියාවලිය 2019 වර්ෂය තුළදී ආරම්භ කර තිබුණි. | උපාධි අපේක්ෂකයින් වෙත අපේක්ෂිත ප්‍රතිලාභ නොලැබේ. | **එස්ටීඑච්ආර්ඩී/කේර්- ඊ3**<br>මෙම කටයුත්තේ අයිතම 82 ක් ඇතුළත් වි ඇති අතර, පරිවිතරයන් ඉතා සංකීර්ණ වූ අතර, අදාල ක්ෂේත්‍රය පිළිබඳ විශේෂඥ දැනුම සහිත තාක්ෂණික නිලධාරින් පීඨයේ නොමැති වීම හේතුවෙන් ආචාර්යවරුන්ගේ අවිවේකි ඉගෙනුම් කාලසටහන නොතකා ඔවුන්ගේ මහත් කැපකිරීමක් අවශ්‍ය විය. එමනිසා, ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකකයට ප්‍රසම්පාදන සැලැස්මේ සඳහන් කාලය තුළ ලංසු ලියවිලි සකස් කර ගැනීමට නොහැකි විය. ඒ අනුව ප්‍රසම්පාදන සැලැස්ම සංශෝධනය කර ඇත. | කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමට කඩිනම් පියවර ගැනීම අවශ්‍ය වේ. |
| (iii) | 2019 දෙසැම්බර් 02 දින අතිරේක තාක්ෂණික ඇගයීම් කමිටුව පරිගණක හා තාක්ෂණික පීඨයේ රසායනික විද්‍යාගාර සඳහා විද්‍යාගාර උපකරණ මිලදී ගැනීමට ආසියානු සංවර්ධන බැංකුව වෙත වාර්තාවක් ඉදිරිපත් කර තිබුණි. කෙසේ වෙතත් | මිලදී ගැනීම් පිළිබඳ දුර්වල පාලනයන් | **එස්ටීඑච්ආර්ඩී/කේර්-ඊ4**<br>ආසියානු සංවර්ධන බැංකුවේ එකගතාවය 2019 ඔක්තෝබර් 11 දින ලබාගැනීමෙන් පසු කොන්ත්‍රාත්තුව 2019 ඔක්තෝබර් 16 දින පිරිනමා ඇත. | ව්‍යාපෘති පරිපාලන අත්පොතෙහි සඳහන් අවශ්‍යතාවයන්ට සමග අනුකූල වීම අවශ්‍ය වේ. |

| | | | | |
|---|---|---|---|---|
| | ආසියානු සංවර්ධන බැංකුවේ එකඟතාවය ලැබීමට පෙර රු.මිලියන 3.52 ක් වටිනා අයිතමයන් 1,487 ක් මිලදී ගෙන තිබුණු අතර ව්‍යාපෘති කළමනාකරණ ඒකකය වෙත ලැබී තිබුණි. | | | |
| (iv) | පරිගණක හා තාක්ෂණික පීඨය සඳහා විදුලිබල උපකරණ (UPS) මිලදී ගැනීමට එකතුව රු.4,047,000 ක් දරා තිබුණි. කොන්ත්‍රාත් ගිවිසුමට අනුව ගිවිසුම්ගත දින සිට දින 07 ක් තුළ ඉහත අයිතමයන් බෙදාහැරිය යුතු වේ. කෙසේවෙතත් මෙම අයිතමයන් විගණිත දින වූ 2020 පෙබරවාරි 25 දින වනවිටත් බෙදාහැර නොතිබුණි. | කොන්ත්‍රාත්කරුන් වෙත අනවශ්‍ය වරප්‍රසාද ලබාදිය හැක. | **<u>එස්ටීඑච්ආර්ඩී/කේර්-ර්6</u>**<br>මෙම අයිතමයන් ගිවිසුම්ගත දින සිට සති 08 ක් ඇතුළත බෙදාහැරිය යුතුය. 2019 නොවැම්බර් 15 හා 2020 ජනවාරි 27 දිනැති ලිපි මගින් සැපයුම් ක්‍රියාවලිය කඩිනම් කිරීමට සැපයුම්කරු දැනුවත් කර තිබුණි. කෙසේවෙතත්, සැපයුම්කරු 2020 පෙබරවාරි 11 දින භාණ්ඩ සපයා තිබුණි. | කොන්ත්‍රාත් ගිවිසුමේ සඳහන් කොන්දේසි සමග අනුකූල වීමට කොන්ත්‍රාත්කරුවන් පෙළඹවීමට පියවර ගැනීම අවශ්‍ය වේ. |
| (v) | ලැබී තිබුණු තොරතුරු අනුව පරිගණක හා තාක්ෂණික පීඨය සඳහා ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 39.99 ක විද්‍යාගාර ලී බඩු සැපයීම, බෙදාහැරීම, ස්ථාපනය සහ ආරම්භ කිරීමේ කොන්ත්‍රාත්තුව 2018 ජූනි 30 දින කොන්ත්‍රාත්කරුවෙකු වෙත පිරිනමා තිබුණු අතර, 2019 අප්‍රේල් 04 දින වනවිට නිම කිරීමට අපේක්ෂා කර තිබුණි. කෙසේවෙතත්, එම කටයුත්ත විගණිත දිනය වූ 2020 පෙබරවාරි 25 දින වනවිටත් අවසන් කර නොතිබුණි. | සැපයුම්කරුගේ දුර්වල කාර්යසාධනය හේතුවෙන් උපාධි අපේක්ෂකයින්ට වර්ෂ 02 ක් පුරා භෞතික හා රසායනික විද්‍යාගාර භාවිතා කිරීමට නොහැකි වී ඇත. | **<u>එස්ටීඑච්ආර්ඩී/කේර්-එෆ් 1</u>**<br>සැපයුම්කරුගේ දුර්වල කාර්යසාධනය හේතුවෙන් ප්‍රසම්පාදන කමිටුව කොන්ත්‍රාත්තුව අවසන් කිරීමට සහ කාර්යසාධනය සුරක්ෂණය අහිමි කිරීමට තීරණය කර තිබුණි.<br>සපයන ලද ලී බඩු සඳහා ද්‍රවශීලතා හානි අඩු කර ගැනීමෙන් පසු ගෙවීම් සිදුකිරීමට පියවර ගනු ලැබේ. | කොන්ත්‍රාත්කරුවන් විසින් සිදුකරනු ලබන කටයුතු පිළිබඳ නියාමනය සහ සුපරීක්ෂණය පිළිබඳ ඉහළ සහ කාර්යක්ෂම කොන්ත්‍රාත් කළමනාකරණ පද්ධතියක් ක්‍රියාත්මක කිරීම අවශ්‍ය වේ. |
| | **<u>සබරගමුව විශ්වවිද්‍යාලය</u>** | | | |
| (i) | කොන්ත්‍රාත්තුවේ සාමාන්‍ය කොන්දේසි අනුව, මිලදීගත් අයිතමයන් දින 28 ක් ඇතුළත පීඨය වෙත සැපයිය යුතුය. කෙසේවෙතත් අයිතමයන් 51 | කොන්ත්‍රාත්රු වෙත අනවශ්‍ය වරප්‍රසාද ලබාදීමක් සිදුකර ඇත. | සැපයුම්කරුගේ විවිධ හේතුන් නිසා සැපයුමේ ප්‍රමාදයන් සිදුවී තිබුණි. එය ගෙවීම් අදියරට පැමිණිවිට ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකකය විසින් ප්‍රසම්පාදන මාර්ගෝපදේශය තරයේ | කොන්ත්‍රාත් ගිවිසුමේ සඳහන් කොන්දේසි සමග අනුකූල වීමට කොන්ත්‍රාත්කරුවන් පෙළඹවීමට පියවර |

| | | | |
|---|---|---|---|
| නියමිත දිනයන්ට සපයා නොතිබුණි. | | අනුගමනය කරමින් ද්‍රවශීලතා හානි අඩු කර ඇත. | ගැනීම අවශ්‍ය වේ. |

**3.4 ඌන උපයෝජිත සම්පත්**

| | විගණන ගැටළු | බලපෑම් | කළමනාකරණයේ අදහස් දැක්වීම් | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| (i) | ව්‍යාපෘති පරිපාලන අත්පොතෙහි සඳහන් මූල්‍ය ඉලක්කවලට අනුව, සමාලෝචිත වර්ෂය අවසාන වනවිට රු.මිලියන 4,976 කට සමාන එජඩො මිලියන 31.9 ක් උපයෝජනය කිරීමට අපේක්ෂා කර තිබුණි. කෙසේවෙතත් 2019 දෙසැම්බර් 31 දිනට එම ඉලක්කයෙන් සියයට 03 ක් හෝ රු.මිලියන 145 කට සමාන එජඩො මිලියන 0.93 ක් පමනක් අත්කරගෙන තිබුණි. | වියපැහැදම් නොවූ ශේෂය මත බැදීම් ගාස්තු වශයෙන් රු.මිලියන 11.51 ක් දැරීමට ශ්‍රී ලංකා රජයට සිදුවේ. | ව්‍යාපෘති පරිපාලන අත්පොතෙහි සංශෝධිත වියපැහැදම් සැලැස්මට අනුව, 2019 වර්ෂය සඳහා අපේක්ෂිත ඉලක්කය රු.මිලියන 684 කට සමාන එජඩො මිලියන 3.8 ක් වේ. (එජඩො 1= 180) 2020 වර්ෂය සඳහා අපේක්ෂිත ඉලක්ක සපුරා ගනිමින් ව්‍යාපෘති කළමනාකරණ උපදේශනය ඇතුළුව සියළුම සිවිල් වැඩ කොන්ත්‍රාත්තු පිරිනැමීමට පියවරගෙන ඇත. | ප්‍රමාද වූ කටයුතු තවදුරටත් ප්‍රමාද නොවී ආවරණය කරගත යුතුය. |
| (ii) | ව්‍යාපෘතිය සමාලෝචිත වර්ෂය තුලදී රු.මිලියන 2,199.2 ක මුළු ප්‍රතිපාදනයෙන් සියයට 5 ක් නියෝජනය කරන රු.මිලියන 108.7 ක් පමනක් උපයෝජනය කර තිබුණි. | ණය මුදලින් සහ ශ්‍රී ලංකා රජයේ දායකත්වයේ වෙන්කිරීම්වල ඌන උපයෝජනයක් වේ. | 2019 වර්ෂය සඳහා සංශෝධිත මුළු ප්‍රතිපාදනය රු.මිලියන 446.5 ක් වේ. ව්‍යාපෘතිය වර්තමාන මුදල් වර්ෂය තුලදී රු.මිලියන 184.5 ක් උපයෝජනය කර ඇත. | ප්‍රමාද වූ කටයුතු තවදුරටත් ප්‍රමාද නොවී ආවරණය කරගත යුතුය. |

**3.5 පද්ධති හා පාලන**

| | විගණන ගැටළු | බලපෑම් | කළමනාකරණයේ අදහස් දැක්වීම් | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| (I) | සබරගමුව විශ්ව විද්‍යාලයේ ව්‍යාපෘති කළමනාකරණ ඒකකයට මිලදීගත් අයිතමයන් සැපයීමෙන් පසු වාර්තා කිරීමේ සුදුසු ක්‍රමවේදයක් හඳුන්වා දි නොතිබුණි. ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් වාර්තා කිරීමක් සහ පරීක්ෂා කිරීමකින් තොරව පීඨය වෙත අයිතමයන් භාරදී ඇති | ප්‍රසම්පාදනය න් පිළිබඳ දුර්වල පරිපාලනය ක් වේ. | ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ සියළුම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකක වෙත ව්‍යාපෘතිය යටතේ මිලදී ගන්නාලද උපකරණ ලැබීමේදී වාර්තා කිරීමේදී සහ බෙදාහැරීම පිළිබඳ උපදෙස් ලබාදී තිබුණි. | ව්‍යාපෘති අරමුදල් මගින් මිලදී ගන්නා අයිතමයන් පිළිබඳ වාර්තා තබා ගැනීමට සහ බෙදාහැරීම පිළිබඳ සුදුසු ක්‍රමවේදයක් හඳුන්වා |

| | | | | |
|---|---|---|---|---|
| | බව නිරීක්ෂණය විය. | | ගැටළු විසඳීමට කෙටිකාලීන පුහුණුවක් සංවිධානය කර ඇත. | දිය යුතුය. |
| (II) | ක්‍රියාකාරි සැලැස්මට අනුව විශ්ව විද්‍යාල 4 හි 2019 වර්ෂය තුලදී ප්‍රසම්පාදන කටයුතු 91 ක් නිම කිරීමට ඉලක්ක කර තිබුණි. කෙසේවෙතත්, සමාලෝචිත වර්ෂය තුලදී ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 474.44 ක් වටිනා කටයුතු 33 නිම කිරීමට හැකි වී තිබුණි. විස්තර පහත දැක්වේ. | එය ව්‍යාපෘතියේ අපේක්ෂිත ප්‍රතිඵල හා ඉලක්කවල ට බලපෑමට ඉඩ ඇත. | ඉලක්කගත කටයුතු 91 කින් 2019 වර්ෂය තුලදී කටයුතු 38 ක් සම්පූර්ණ කර තිබුණි. 2019 වර්ෂය තුලදී ආරම්භ කරන ලද සමහර කටයුතු 2020 වර්ෂය දක්වා සිදුකරමින් පැවතුණි. 2020 දි ක්‍රියාකාරී සැලැස්මට අනුව මිලදි ගැනීම් සිදුකිරීමට පියවර ගනු ලැබේ. | ප්‍රමාදයන් ආවරණය කිරීමට සහ අමතර පිරිවැය වළක්වා ගැනීමට කාලීනව ප්‍රසම්පාදන කටයුතු නිම කිරිම සහතිකක වීමට පියවර ගැනීම අවශ්‍ය වේ. |

| **විශ්ව විද්‍යාලයේ නම** | **සම්පූර්ණ නොකරන ලද කටයුතු ගණන** | **අසම්පූර්ණ කටයුතුවල වටිනාකම** |
|---|---|---|
| | | **(රු.)** |
| (අ) කැළණිය | 02 | 67,500,000 |
| (ආ) රජරට | 10 | 81,771,840 |
| (ඇ) සබරගමුව | 05 | 102,133,800 |
| (ඇ)ජයවර්ධනපුර | 16 | 223,016,400 |
| **එකතුව** | 33 | 474,422,040 |